මාධ්‍ය නිවේදනය

2023 අගෝස්තු 11

කොළඹ, ශ්‍රී ලංකාව

*For Immediate Release*

අපි ණය නැහැ ! අපි ගෙවන්නේ නැහැ !

ශ්‍රී ලංකාවේ කාන්තාවෝ පවතින ණය අර්බුදය හමුවේ ආර්ථික යුක්තිය ඉල්ලා සිටි

ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කරන කන්ඩායම් ශ්‍රී ලංකාවේ කම්කරු පන්තිය, විශේෂයෙන්ම එහි කාන්තාවන් මත ආපසු ගෙවීමේ බර පටවන වත්මන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ විසඳුම් ප්‍රතික්ෂේප කරයි. ඔවුන් ශ්‍රී ලංකාවේ පවතින ණය අර්බුදය සඳහා, ජනතාවගේ සැබෑ ජීවන අත්දැකීම්, අරගල සහ අවශ්‍යතාවලට ආමන්ත්‍රණය කරන, කඩිනම් සහ තිරසාර විසඳුම් ඉල්ලා සිටි.

2023 අගෝස්තු 9-10 දිනවල කොළඹදී පැවති 'ණය සහ කාන්තා මානව හිමිකම් පිළිබඳ ජාතික සමුළුවේදී', ශ්‍රී ලංකාවේ සහ අනෙකුත් ආසියානු රටවල කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම්, පවතින අර්බුදය ඔවුන්ගේ ජීවිතවලට බලපා ඇති ආකාරය සහ ඒවාට ප්‍රමාණවත් ලෙස ප්‍රතිචාර දැක්වීමට රජයේ විසඳුම් අපොහොසත් විම පිළිබඳව සාකච්ඡා කළහ. අසාධාරණ කප්පාදු පියවරයන් **(austerity measures)** පැනවීමේ දී ජාත්‍යන්තර මූල්‍ය ආයතන, ප්‍රධාන වශයෙන් ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉටු කරන ලද ඓතිහාසික හා වර්තමාන භූමිකාවන් ද, කලාපයේ නරක අතට හැරෙන ආර්ථික අර්බුද සම්බන්ධයෙන් ඔවුන්ගේ වගවීම නොමැතිකම ද ඔවුහු දැඩි ලෙස විවේචනය කළහ.

2023 මාර්තු වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 103.8% ක් වූ දරාගත නොහැකි ණය බරක් හේතුවෙන් ශ්‍රී ලංකාව මේ වන විට ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටී. මෙම අර්බුදය කුටුම්භවලට බලපෑවේ බොහෝ දෙනෙක් කොවිඩ් 19 හි කම්පනයෙන් තවමත් සුවය ලබා නොතිබූ අවස්ථාවකය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ලබා ගැනීම සඳහා අවශ්‍ය කප්පාදු පියවර රජය විසින් කිසිදු මහජන අදහස් විමසීමකින් තොරව කඩිමුඩියේ දියත් කරමින් සිටී. මෙයට රාජ්‍ය වියදම් කපා හැරීම, විදුලිය, ජලය වැනි උපයෝගිතා ගාස්තු දැඩි ලෙස ඉහල දැමීම, ආහාර සහ බලශක්ති වියදම්, වක්‍ර සහ ප්‍රතිගාමී බදුකරණය, සමාජ ආරක්ෂණය ලෙස සීමිත මුදල් ප්‍රදානයන් ඇතුළත් වේ.

මෙය විශේෂයෙන්ම අඩු හා මධ්‍යම ආදායම්ලාභී පවුල්වලට බලපාන අතර වැටුප් සහ රැකියා සුරක්ෂිතතාවයේ සම්බන්ධයෙන් අත්කරගෙන තිබූ අයිතිවාසිකම් අහෝසි කරවන කම්කරු නීති සංශෝධනයන්ට මුල් වී තිබේ. වඩාත් බරපතලව, ශ්‍රී ලංකා රජය ශ්‍රී ලංකාවේ ණය ගෙවීම සඳහා සේවක අර්ථසාධක අරමුදල්වල ඉපැයීම් භාවිතා කිරීමට තීරණය කර ඇත. මේ මගින් ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියට ධනවත්ම ණය හිමියන්ගේ ණය ආපසු ගෙවීමේ බර දැරීමට බල කරමින්, ඊට එරෙහි ප්‍රතිරෝධය සහ නීතිමය අභියෝග අවහිර කර ඇත.

"ලෝකයේ ධනවත්ම ආදායම් ලබන්නන්ගේ ණය ගෙවීම සඳහා කම්කරුවන්ගේ සමාජ ආරක්ෂණ අරමුදල් අවදානමකට ලක්කර තිබේ. ශ්‍රී ලංකාවේ වඩාත්ම වෙහෙස මහන්සි වී වැඩ කරන සමහර

අයගේ ඉතිරිකිරීම් විකුණා දැමීමට රජය තීරණය කර ඇත - ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ එකම ඉතිරිය මෙයයි'' නීතිඥ සහ ක්‍රියාකාරිනියක වන ලක්මාලි හේමචන්ද්‍ර පැවසීය. ''දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ දැඩි අයිතිවාසිකම් උල්ලංඝනයන් සිදුවෙමින් පවතී. ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සැප්තැම්බර් මාසයේදී අවසන් වීමට නියමිත අතර එම කාලය වන විට කම්කරුවන්ට ඔවුන්ගේ ඉතිරිකිරීම්වල ආරක්ෂාව අහිමි වනු ඇත. කම්කරුවන්ගේ ඉතුරුම්වලින් ණය හිමියන්ට ගෙවීමත්, රජය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ සඳහා මිනිසුන්ගේ අනුමැතිය ඇතැයි යනුවෙන් ප්‍රකාශ කරන ස්ථාවරයත් හෙලා දකින ලෙස අපි ජාත්‍යන්තර ප්‍රජාවෙන් ඉල්ලා සිටිනවා. ඇත්තටම මේ සඳහා ජනතා අනුමැතියක් නෑ, නමුත් ජනතාවට තමන්ගේ විරෝධතාවය ප්‍රකාශ කිරීමට මාර්ගයක් නෑ'' හේමචන්ද්‍ර පැවසීය.

ආර්ථික අර්බුදය තුළින් මෙන්ම ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වත්මන් රජය ඉදිරිපත් කරන විසඳුම් යන දෙකින්ම කාන්තාවන් අසමානුපාතික ලෙස පීඩාවට පත්වන බව සමුළුව යළිත් තහවුරු කළේය. පවුල තුළ ගෙවීම් නොලබන සුරකුම් භූමිකාවන් හේතුවෙන්, කාන්තාවන් බොහෝ විට තම පවුල් පෝෂණය, රැකවරණය සහ අධ්‍යාපනය සහතික කිරීමේ වගකීම්වලට උර දෙයි. ඔවුන් පහත වැටෙන වැටුප්, ඉහළ යන ආහාර, විදුලි සහ ජල බිල්පත්, අවිනිශ්චිත හා අවිධිමත් රැකියා සහ අර්ථවත් සමාජ ආරක්ෂණය සඳහා ප්‍රවේශය නොමැතිකමට මුහුණ දෙයි. "පවුල්වලට තම මූලික ආහාර අවශ්‍යතා සපුරා ගත හැක්කේ දෛනික ණය, සතිපතා ණය සහ අනෙකුත් ඉතා ඉහළ පොලී අනුපාතවලට ණය ගැනීමෙන් පමණි. අපේ ආදායමෙන් මූලික අවශ්‍යතා කළමනාකරණය කරගන්න බැහැ. මෙය සාධාරණ වන්නේ කෙසේද? " යැයි ආර්ථික යුක්තිය සඳහා වන ස්ත්‍රීවාදී සාමූහිකයේ සුගන්‍යා කාන්දීපන් මහත්මිය පැවසුවාය.

සමාජ ආරක්ෂණය යනු පුන්‍යාධාරයක් නොව සියලු මිනිසුන්ගේ මානව අයිතිවාසිකමකි. කාන්තා කණ්ඩායම් ඉල්ලා සිටින්නේ මෙම අර්බුදකාරී අවස්ථාවේ විශ්වීය සමාජ ආරක්ෂාව නීතියෙන් බැඳී හා බලාත්මක කළ හැකි බවට පත් කරන ලෙසයි. සමාජ ආරක්ෂණ ජාලය අර්ථවත් ලෙස ව්‍යාප්ත කිරීමෙන් සහ මූල්‍ය ප්‍රතිපාදන වැඩි කිරීමකින් තොරව, ඇස්වැසුම වැනි ඉලක්කගත යෝජනා ක්‍රම අර්බුදයෙන් දැඩි ලෙස පීඩාවට පත් මිලියන සංඛ්‍යාත පවුල්වලට ප්‍රතිලාභයක් නොවනු ඇත. "විශ්වීය සමාජ ආරක්ෂාව සඳහා අරමුදල් සැපයීම සඳහා, අපි රජයට බලකර සිටින්නේ ධනවතුන්ට බදු පැනවීම, සමාගම්වලට බදු පැනවීම සහ වැට් බද්ද වැනි ප්‍රතිගාමී පාරිභෝගික බදු වහාම ක්‍රියාත්මක වන පරිදි අඩු කරන ලෙසත්, සමාජ ආරක්ෂාව සඳහා වත්මන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.6% සීමාවෙන් ඔබ්බට අයවැය ප්‍රතිපාදන පුළුල් කරන ලෙසත්ය. ගෘහස්ථ ණය අර්බුදය සමනය කිරීම සහතික කළ වැඩ කරන දින, සතිපතා පෝෂණ ආහාර කූඩය, සෞඛ්‍ය සහ අධ්‍යාපන සහාය සහ ප්‍රවාහන සහාය වැනි සහායන් ඇතුළත් වන පරිදි අපි සමාජ ආරක්ෂණය පුළුල් කළ යුතුය:. - සරලා එමානුවෙල්, ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී සාමූහිකය.

ණය සහ මානව හිමිකම් පිළිබඳ හිටපු එක්සත් ජාතීන්ගේ ස්වාධීන විශේෂඥ ජුවාන් පැබ්ලෝ බොහොස්ලාව්ස්කි පැවසුවේ, "දේශීය ණය හිමියන්ට පමණක් කැපකිරීමක් කිරීමට සහ ඔවුන්ගේ ණය කප්පාදුව පිළිගැනීමට රජය ඉල්ලා ඇත්තේ මන්දැයි අපි ප්‍රශ්න කළ යුතුය. ස්වෛරී ණය තිරසාර මට්ටමකට ගෙන ඒම සඳහා සමාන දායකත්වයක් ලබා දෙන ලෙස විදේශ ණය හිමියන්ගෙන් ද ඉල්ලා සිටිය යුතුය. ජාත්‍යන්තර නීතියට අනුව, ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, වෙනස් කොට සැලකීම තහනම් කිරීම යනු ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ණය හිමියන් අතර සමානත්වය තහවුරු කිරීමයි.

ශ්‍රී ලංකාව ආසියාවේ සහ පැසිෆික් කලාපයේ දැනට ණය අර්බුදය බලපෑම් සමඟ පොරබදමින් සිටින රටවල් කිහිපයෙන් එකකි. ආසියා පැසිෆික් කලාපය පුරා සිටින කාන්තා අයිතිවාසිකම් කණ්ඩායම් ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ සහයෝගීතාවය ප්‍රකාශ කර ඇති අතර, නීතිය හා සංවර්ධනය පිළිබඳ

ආසියානු පැසිපික් සංසදෙය් (APWLD) හි ප්‍රාදේශීය සම්බන්ධීකාරක මිසුන් වූ පැවසුවේ, “ණය අර්බුදයක් තුළ කාන්තාවන් මුහුණ දීමට සිදුවන සමාන ප්‍රවණ්ඩත්වයන් පිළිබඳ කතා අසීමිත සංඛ්‍යාවක් අසන්නට ලැබීම පිළිකුලකි. මිනිසුන්ගේ ජීවිතය, අභිමානය සහ ස්වෛරී බලය උදුරා ගන්නා නව යටත්විජිතවාදයේ සහ අධිරාජ්‍යවාදයේ පැහැදිලි ප්‍රකාශනයක් වන ‘ණය සූත්‍රයක්’ ඇති බව ආසියා සහ පැසිෆික් කලාපය පුරා සිටින කාන්තාවන්ගේ කථා සනාථ කරයි. APWLD ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ ජනතාව සමඟ සහෝදරාත්මකව බැඳෙන අතර යුක්තිය සහ නිදහස සඳහා වන ඔබේ අරගලවලට සම්බන්ධ වේ. "

නීතිය සහ සමාජ භාරය, ජාතික ධීවර සහයෝගීතා ව්‍යාපාරය, කාන්තාව හා මාධ්‍ය සාමූහිකය, කලම්බු අර්බන් ලැබ්, නීතිය හා සංවර්ධනය පිළිබඳ ආසියානු පැසිපික් සංසදය විසින් මෙම ජාතික සමුළුව සම-සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ සහ ආසියාවේ කම්කරු ක්‍රියාකාරීන්, වෘත්තීය සමිති, ග්‍රාමීය හා නාගරික කාන්තාවන්, විද්වතුන් සහ සිවිල් සමාජයේ නියෝජිතයින් මේ සඳහා සහභාගි විය.

ප්‍රයෝජනවත් සබැඳි

නීතිය හා සමාජ භාරය - https://www.lstlanka.org/

ජාතික ධිවර සහයෝගිතා ව්‍යාපාරය - https://www.nafso-online.org/

කලම්බු අර්බන් ලැබ් - https://www.csf-asia.org/colombo-urban-lab/

කාන්තාව හා මාධ්‍ය සාමූහිකය – www.womenandmediacollective.org

ආර්ථික සාධාරණත්වය සඳහා වන ස්ත්‍රීවාදී එකමුතුව - https://www.srilankafeministcollective.org/

නීතිය හා සංවර්ධනය පිළිබඳ ආසියානු පැසිපික් සංසදය – www.apwld.org

වැඩි දුර තොරතුරු සඳහා

නීතිය හා සමාජ භාරය වෙනුවෙන්:
සඳුන් තුඩුගල, වැඩසටහන් ප්‍රධානි
Mobile: +94773727271 / Email: hop@lstlanka.org

**APWLD** වෙනුවෙන්
ලින් පානෝ, වැඩසටහන් කළමනාකරු
Whatsapp: +63 961 4762844 / Email: lyn@apwld.org